# මාධ්‍ය නිවේදනය


සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


ශ්‍රී ලංකා මහ බැංකුව

இலங்கை மத்திய வங்கி

CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2024 මැයි 31 |


## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2024 අප්‍රේල්

### සුවිශේෂී කරුණු

- ආනයන ඉහළ යෑමට වඩා වැඩි අගයකින් අපනයන ඉහළ යෑම හේතුවෙන් (වාර්ෂික ලක්ෂ්‍යමය මත) 2024 වසරේ අප්‍රේල් මාසයේ දී වෙළඳ හිඟය අඩු විය. කෙසේ වෙතත්, 2024 වසරේ ජනවාරි-අප්‍රේල් කාලපරිච්ඡේදය සඳහා සමස්ත වෙළඳ හිඟය පුළුල් විය.
- සෘතුමය රටාවට අනුකූලව 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සංචාරක පැමිණීම් මන්දගාමී වුවද, සංචාරක අංශයේ වර්ධනය අඛණ්ඩව පවතියි.
- සේවා අංශ වෙත වූ අනෙකුත් ලැබීම් 2024 වසරේ පළමු මාස හතර තුළ ශක්තිමත්ව පැවතුණි.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ විදේශීය ජංගම ගිණුමට සහ විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවයට සැලකිය යුතු ලෙස අඛණ්ඩව දායක විය.
- 2024 වසරේ අප්‍රේල් මාසයේදී ද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් විදේශ ආයෝජන ගෙවීම් අඛණ්ඩව සිදු විය.
- දළ නිල සංචිත 2023 වසර අවසානයට සාපේක්ෂව එ.ජ. ඩො. බිලියන 1කට වඩා වැඩිවීමක් වාර්තා කරමින් 2024 වසරේ අප්‍රේල් මාසය අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 5.5ක් විය.
- 2024 වසරේ මැයි මස අවසානය දක්වා වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය.

### භාණ්ඩ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය










### සංචාරක ඉපැයීම්

**2024 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 226**

2023 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 148

**52.3% (වාර්ෂික වර්ධනය)**




### සේවා අංශය*
(සංචාරක ඉපැයීම් හැර)




* අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතියට (ITRS) ලැබුණු දත්ත මත පදනම් වේ.

### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

**2024 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 544**

2023 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 454

**19.8% (වාර්ෂික වර්ධනය)**




### දළ නිල සංචිත*




* චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.

### රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ ලැබීම්
(ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ - ශුද්ධ)




### විනිමය අනුපාතිකයේ වෙනස්වීම්
(2024 ජනවාරි 01 – 2024 මැයි 31)



## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය

වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2023 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 583ක සිට 2024 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 558ක් දක්වා අඩු විය. කෙසේවුවද, එය 2024 වසරේ මාර්තු මාසයේ වෙළඳ හිඟයට (එ.ජ. ඩොලර් මිලියන 359ට) සාපේක්ෂව ඉහළ ගියේය. මේ අතර 2024 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුළ එ.ජ. ඩොලර් මිලියන 1,777ක් වූ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,479ක වෙළෙඳ හිඟයට සාපේක්ෂව පුළුල් විය.

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2023 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 849ට සාපේක්ෂව 2024 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 878ක් දක්වා සියයට 3.4කින් ඉහළ ගියේය.** සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල ආදායම්හි වර්ධනයක් දක්නට ලැබුණු අතර ඇඟලුම් අපනයනවල අඩුවීමක් වාර්තා වුවද ඉහළම වර්ධනය කාර්මික භාණ්ඩ අපනයනවල සිදු විය. 2024 වසරේ අප්‍රේල් මාසයේ දී **කාර්මික භාණ්ඩ** අපනයනයන්හි ඉහළ යෑම සඳහා නැව් සහ ගුවන් යානා ඉන්ධන අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. කුළුබඩු අපනයනයේ අඩුවීමක් තිබියදීත්, මූලිකව පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන සහ තේ අපනයන (ප්‍රධාන වශයෙන් පරිමාවන්) ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ අප්‍රේල් මාසයේ දී **කෘෂිකාර්මික භාණ්ඩ** අපනයන ආදායම ඉහළ ගියේය. 2024 වසරේ අප්‍රේල් මාසයේ දී **ඛනිජමය අපනයන** ආදායම ද ඉහළ ගියේය. කෙසේවුවද, 2024 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2024 වසරේ අප්‍රේල් මාසයේ දී අපනයන ආදායම පහළ ගිය අතර ඒ සඳහා උත්සව සමයේ බලපෑම හේතුවෙන් අපනයන පුළුල් පදනමක් මත පහළ යෑම හේතු විය.

**රූප සටහන 1: අපනයන සංයුතිය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

[1] වෙළඳ භාණ්ඩ සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් සංයුතීන්, පිළිවෙළින්, ඇමුණුම II, ඇමුණුම III, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[1]

**වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2023 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,431ට සාපේක්ෂව 2024 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,435ක් දක්වා සියයට 0.3කින් සුළු වශයෙන් ඉහළ ගියේය.** ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා හේතු වූ අතර අන්තර් සහ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමේ පහළ යෑමක් වාර්තා විය. 2024 වසරේ අප්‍රේල් මාසයේ **පාරිභෝගික භාණ්ඩ** ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ යෑම සඳහා බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑමෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවිය. මේ අතර, 2023 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව ඉන්ධන ආනයන වියදම පහළ යෑම, **අන්තර් භාණ්ඩ** ආනයන වියදම පහළ යෑමට මූලික වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2024 වසරේ අප්‍රේල් මාසයේ දී රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, මූල ලෝහ (මූලිකව යකඩ හා වානේ), සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය. **ආයෝජන භාණ්ඩ** ආනයන වියදම ද පුළුල් පදනමකින් ඉහළ ගිය අතර, ඒ සඳහා මූලිකව යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන හේතු විය. මේ අතර, 2024 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2024 වසරේ අප්‍රේල් මාසයේ දී ආනයන වියදම පහළ ගිය අතර, ඒ සඳහා ඉන්ධන ආනයන වියදම පහළ යෑම හේතු විය.

**රූප සටහන 2: ආනයන සංයුතිය**




**මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

## වෙළඳ දර්ශක[2]

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2023 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සියයට 9.6කින් වර්ධනය වූ අතර, ඒ සඳහා අපනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

2024 වසරේ අප්‍රේල් මාසයේ දී අපනයන ආදායම 2023 වසරේ අප්‍රේල් මාසයට සාපේක්‍ෂව ඉහළ යෑම සඳහා ඉහළ අපනයන පරිමාවන් හේතු වූ බව නිරූපණය කරමින් අපනයන පරිමා දර්ශකය සියයට 5.0කින් ඉහළ ගිය අතර, අපනයන ඒකක මිල දර්ශකය සියයට 1.5කින් පහළ ගියේය.

එසේම, 2024 වසරේ අප්‍රේල් මාසයේ දී ආනයන වියදම 2023 වසරේ අප්‍රේල් මාසයට සාපේක්‍ෂව ඉහළ යෑම සඳහා ද ඉහළ ආනයන පරිමාවන් හේතු වූ බව නිරූපණය කරමින් ආනයන පරිමා දර්ශකය සියයට 11.7කින් ඉහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 10.2කින් පහළ ගියේය.

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: අපනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

[2] එ.ජ. ඩොලර් වටිනාකම අනුව

## සේවා අංශයේ ක්‍රියාකාරීත්වය[3]

**සංචාරක ඉපැයීම්:** 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සංචාරක ඉපැයීම්, 2024 වසරේ මාර්තු මාසය සඳහා ඇස්තමේන්තු කළ එ.ජ. ඩොලර් මිලියන 338ට සහ 2023 වසරේ අප්‍රේල් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 148ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 226ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 6: මාසික සංචාරක ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 7: මාසික සංචාරක පැමිණීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**සේවා අංශයේ අනෙකුත් ලැබීම්[4] :** 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සේවා අංශය වෙත වූ අනෙකුත් ලැබීම් ඉහළ යාමට ප්‍රධාන දායකත්වය සපයන ලද්දේ පරිගණක, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවාවන්ය. කෙසේ වෙතත්, 2023 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව මුහුදු ප්‍රවාහන සේවාවල අඩු වීමක් වාර්තා විය. 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සේවා අංශය වෙත වූ මුළු ලැබීම් (සංචාරක ඉපැයීම් හැර) 2023 වසරේ අප්‍රේල් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 280ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 330ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 8: සේවා අංශය වෙත වූ ප්‍රධාන ලැබීම් (සංචාරක ඉපැයීම් හැර)**

**2024 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 330**
2023 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 280
**17.7% (වාර්ෂික වර්ධනය)**

**2024 ජන.-අප්‍රේ.: එ.ජ. ඩො. මිලියන 1,157**
2023 ජන.-අප්‍රේ.: එ.ජ. ඩො. මිලියන 1,049
**10.2% (වාර්ෂික වර්ධනය)**




මූලය: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

---

[3] ශ්‍රී ලංකා මහ බැංකුව සිය අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) මත පදනම්ව, උප කාණ්ඩවල දත්ත ද ඇතුලත් වන පරිදි, 2024 වසරේ ජනවාරි මාසයේ සිට සේවා අංශයේ සංඛ්‍යාලේඛන මාසිකව වාර්තා කිරීම ආරම්භ කරන ලදී.

[4] තාවකාලික

**සේවා අංශයේ ගෙවීම්[4] :** 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සේවා අංශය වෙතින් වූ ගෙවීම් ප්‍රධාන වශයෙන් ගුවන් ප්‍රවාහනය, මුහුදු ප්‍රවාහනය, විදේශ සංචාර සහ තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත හා වෙනත් ව්‍යාපාරික සේවාවන් සම්බන්ධයෙන් වාර්තා විය. 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සේවා අංශය වෙතින් වූ මුළු ගෙවීම් 2023 වසරේ අප්‍රේල් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 139ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 188ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 9: සේවා අංශයේ ප්‍රධාන ගෙවීම්**

**2024 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 188**
2023 අප්‍රේල්: එ.ජ. ඩො. මිලියන 139
**35.7% (වාර්ෂික වර්ධනය)**

**2024 ජන.-අප්‍රේ.: එ.ජ. ඩො. මිලියන 759**
2023 ජන.-අප්‍රේ.: එ.ජ. ඩො. මිලියන 629
**20.8% (වාර්ෂික වර්ධනය)**




**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2023 වසරේ අප්‍රේල් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 454ට සහ 2024 වසරේ මාර්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 572ට සාපේක්ෂව 2024 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 544ක් විය.

**රූප සටහන 10: මාසික විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

---

[4] තාවකාලික

## මූල්‍ය ලැබීම්

2024 වසරේ අප්‍රේල් මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි එ. ජ. ඩොලර් මිලියන 24ක විදේශ ආයෝජනවල ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ ජනවාරි-අප්‍රේල් කාලය තුළදී එ. ජ. ඩොලර් මිලියන 113ක සමස්ත ශුද්ධ ගෙවීමක් වාර්තා විය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත්, කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ලැබීම්, 2024 වසරේ අප්‍රේල් මාසයේ දී සුළු ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, 2024 වසරේ ජනවාරි-අප්‍රේල් කාලය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 23ක සමස්ත ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

දළ නිල සංචිත 2024 වසරේ අප්‍රේල් මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 5.5ක් දක්වා ඉහළ ගියේය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීමේ දී ඇතැම් කොන්දේසිවලට යටත් වේ. දළ නිල සංචිත ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත දේශීය විදේශීය විනිමය වෙළඳපොළෙන් සැලකිය යුතු ලෙස විදේශ විනිමය මිලදී ගැනීමයි. 2024 වසරේ අප්‍රේල් මාසයේ ශුද්ධ මැදිහත්වීම් එ.ජ. ඩොලර් මිලියන 420ක් වූ අතර (වෙළඳ දිනය මත පදනම්ව) 2024 වසරේ පළමු මාස හතර තුළ ශුද්ධ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් බිලියන 1.6ක් ලෙස සටහන් විය. මේ අතර, දළ නිල සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත්ව) මගින් ආවරණය කළ හැකි ආනයන ප්‍රමාණය 2023 වසරේ දෙසැම්බර් මාසයේ සිට ආනයනික මාස 3හි සීමාවට ඉහළින් පැවති අතර, 2024 වසරේ අප්‍රේල් මස අවසන් වන විට එය ආනයනික මාස 3.8ක් විය.

**රූප සටහන 11: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**2024 වසරේ මේ දක්වා සමස්තයක් වශයෙන් රුපියල අතිප්‍රමාණය වුවද, 2024 වසරේ මැයි මාසයේදී යම් අවප්‍රමාණය වීමේ පීඩනයක් දක්නට ලැබුණි.** 2024 වසරේ මැයි මස 31 දක්වා වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 7.3කින් අතිප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2024 වසරේ මැයි මස 31 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ, ස්ටර්ලින් පවුම, චීන යුවාන්, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. රුපියලෙහි වූ නාමික අතිප්‍රමාණයට අනුකූලව 2024 වසරේ අප්‍රේල් මාසය තුළ දී මුදල් වර්ග 24කින් සැදුම් ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) අතිප්‍රමාණය විය. ඒ අනුව, 2024 වසරේ මේ දක්වා විදේශීය තරඟකාරීත්වයෙහි අඩු වීමක් පිළිඹිබු කරමින්, මූ.ස.වි.අ. 24හි දර්ශකය 2023 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට පැවති 70.2ක සිට 2024 වසරේ අප්‍රේල් මස අවසාන වන විට 77.3ක් දක්වා වෙනස් විය.

**රූප සටහන 12: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 13: විනිමය අනුපාතිකයෙහි සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස් වීම** (2024 ජනවාරි 01 – 2024 අප්‍රේල් 30)




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 1: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2022 | 2023 | 2024 (මැයි 31 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -44.8% | +12.1% | +7.3% |
| යූරෝ | -41.4% | +7.9% | +9.8% |
| ස්ටර්ලින් පවුම | -38.1% | +6.0% | +7.4% |
| චීන යුවාන් (රෙන්මින්බි) | -39.8% | +14.3% | +9.5% |
| ජපන් යෙන් | -36.4% | +19.5% | +18.9% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -40.8% | +10.8% | +10.7% |
| ඉන්දියානු රුපියල | -38.6% | +12.6% | +7.5% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිරි දින දර්ශනයට අනුව, 2024 වසරේ මැයි මාසය සඳහා වන විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පුවත්පත් නිවේදනය 2024 වසරේ ජූනි මස 28 වන දින නිකුත් කරනු ඇත.**

ඇමුණුම I :

**වෙළඳ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)**

| කාණ්ඩය | අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන) | අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 848.6 | 877.6 | 3.4 | 3,846.2 | 4,056.1 | 5.5 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,431.2 | 1,435.2 | 0.3 | 5,325.2 | 5,833.2 | 9.5 |
| වෙළඳ ශේෂය | -582.6 | -557.7 | | -1,479.0 | -1,777.1 | |
| සේවා ගිණුමේ ශේෂය (ශුද්ධ) | 290.0 | 367.7 | 26.8 | 1,072.5 | 1,648.7 | 53.7 |
| සේවා අංශයට වූ ලැබීම් | 428.6 | 555.8 | 29.7 | 1,701.2 | 2,408.1 | 41.6 |
| *ඒවායින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් | 148.2 (ආ) | 225.7 (ඇ) | 52.3 | 652.2 (ආ) | 1251.6 (ඇ) | 91.9 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 55.2 | 70.6 | 27.9 | 258.5 | 257.9 | -0.2 |
| මුහුදු ප්‍රවාහනය | 105.9 | 75.5 | -28.7 | 268.7 | 314.6 | 17.1 |
| ගුවන් ප්‍රවාහනය | 57.7 | 54.3 | -5.9 | 252.0 | 217.6 | -13.6 |
| සේවා අංශයේ ගෙවීම් | 138.6 | 188.1 | 35.7 | 628.7 | 759.4 | 20.8 |
| *ඒවායින්,* | | | | | | |
| විදේශ සංචාර | 9.2 | 19.6 | 114.1 | 39.9 | 72.0 | 80.5 |
| මුහුදු ප්‍රවාහනය | 18.2 | 26.3 | 44.6 | 85.8 | 107.0 | 24.8 |
| ගුවන් ප්‍රවාහනය | 27.4 | 42.9 | 56.8 | 170.1 | 146.7 | -13.7 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 10.3 | 20.1 | 95.6 | 41.9 | 76.0 | 81.5 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 454.0 | 543.8 | 19.8 | 1,867.2 | 2,079.9 | 11.4 |
| පුද්ගලික සංක්‍රාම සඳහා ගෙවීම් | 8.7 | 11.7 | 34.9 | 44.1 | 44.9 | 1.7 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 2.8 | 0.3 | | 3.9 | 23.4 | |
| රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශ විනිමය ලැබීම් | 140.0 | -24.2 | | 252.2 | -113.0 | |
| සමස්ත ශේෂය | | | | 883.3 | 1,288.2 | |
| ***විශේෂිත අයිතමයන්*** | | | | | | |
| සංචාරක පැමිණීම් | 105,498 | 148,867 | | 441,177 | 784,651 | |
| විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් | 20,013 | 20,876 | | 96,038 | 95,795 | |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2023 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඇ) 2024 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඇ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත්ව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

ඇමුණුම II:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන) | අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **660.9** | **683.2** | **3.4** | **3,035.6** | **3,210.1** | **5.7** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 36.1 | 44.4 | 23.2 | 160.9 | 206.3 | 28.3 |
| සත්ත්ව ආහාර | 10.0 | 10.2 | 2.3 | 47.6 | 47.3 | -0.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 343.8 | 321.7 | -6.4 | 1,616.7 | 1,570.0 | -2.9 |
| එයින්, ඇඟලුම් | 310.8 | 292.0 | -6.0 | 1,468.7 | 1,437.7 | -2.1 |
| රෙදිපිළි | 25.3 | 22.2 | -12.0 | 114.2 | 94.4 | -17.4 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 7.7 | 7.4 | -4.1 | 33.8 | 37.9 | 12.2 |
| රබර් නිෂ්පාදිත | 53.2 | 65.1 | 22.4 | 286.1 | 326.9 | 14.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 34.8 | 29.8 | -14.6 | 172.5 | 142.7 | -17.3 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 47.8 | 35.3 | -26.2 | 208.8 | 168.1 | -19.5 |
| ප්‍රවාහන උපකරණ | 15.3 | 5.1 | -66.3 | 38.3 | 32.5 | -15.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 38.5 | 90.6 | 135.1 | 168.7 | 369.8 | 119.2 |
| රසායනික නිෂ්පාදිත | 15.1 | 15.7 | 3.7 | 61.4 | 72.8 | 18.5 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 9.1 | 8.9 | -2.6 | 38.8 | 39.7 | 2.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 7.7 | 2.3 | -69.7 | 24.2 | 14.6 | -39.8 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.5 | 6.8 | 22.8 | 21.7 | 19.7 | -8.8 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 4.0 | 3.9 | -3.7 | 19.0 | 17.9 | -6.0 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 14.7 | 14.9 | 1.3 | 56.8 | 63.3 | 11.5 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.2 | 1.9 | -9.8 | 10.5 | 9.0 | -14.2 |
| වෙනත් කාර්මික අපනයන | 23.0 | 26.6 | 15.7 | 103.5 | 109.6 | 5.9 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **184.0** | **189.1** | **2.8** | **792.3** | **828.4** | **4.6** |
| තේ | 93.4 | 95.5 | 2.2 | 407.7 | 450.2 | 10.4 |
| රබර් | 2.2 | 1.4 | -32.7 | 12.9 | 8.1 | -37.2 |
| පොල් | 25.4 | 30.0 | 18.2 | 101.2 | 125.6 | 24.1 |
| කුළුබඩු | 20.6 | 17.9 | -13.3 | 121.3 | 84.7 | -30.2 |
| එළවළු | 2.1 | 3.5 | 68.3 | 9.2 | 9.2 | 0.6 |
| සකස් නොකළ දුම්කොළ | 2.0 | 1.2 | -38.6 | 8.9 | 7.0 | -21.7 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 13.5 | 12.8 | -5.6 | 39.6 | 52.9 | 33.5 |
| මුහුදු ආහාර | 24.9 | 26.8 | 7.7 | 91.5 | 90.7 | -0.9 |
| **3. ඛනිජ අපනයන** | **1.4** | **2.3** | **60.0** | **9.1** | **8.4** | **-7.9** |
| **4. වර්ග නොකළ අපනයන** | **2.3** | **2.9** | **30.2** | **9.3** | **9.2** | **-0.9** |
| **මුළු අපනයන** | **848.6** | **877.6** | **3.4** | **3,846.2** | **4,056.1** | **5.5** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම III:

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| **කාණ්ඩය** | **අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන)** | **අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන)** | **වෙනස (%)** | **ජන.- අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන)** | **ජන.- අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන)** | **වෙනස (%)** |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **192.7** | **201.8** | **4.7** | **841.4** | **904.0** | **7.4** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 28.4 | 31.9 | 12.0 | 104.0 | 106.3 | 2.2 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 5.2 | 5.1 | -3.3 | 22.7 | 24.8 | 9.6 |
| 05 එළවළු හා පලතුරු | 29.6 | 35.0 | 18.3 | 112.5 | 147.6 | 31.2 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 114.9 | 114.4 | -0.5 | 528.0 | 537.9 | 1.9 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **11.3** | **13.5** | **20.4** | **52.7** | **54.3** | **3.1** |
| 11 පාන වර්ග | 6.3 | 6.7 | 5.4 | 23.4 | 26.9 | 15.2 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 4.9 | 6.9 | 39.5 | 29.3 | 27.4 | -6.5 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **29.2** | **31.7** | **8.7** | **129.1** | **128.0** | **-0.8** |
| 23 සකස් නොකළ රබර් | 2.2 | 1.6 | -29.8 | 13.4 | 8.7 | -35.2 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 17.7 | 18.2 | 2.8 | 71.8 | 74.6 | 3.9 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **38.5** | **90.6** | **135.1** | **168.7** | **369.8** | **119.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 38.5 | 90.6 | 135.1 | 168.7 | 359.5 | 113.1 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | - | - | - | 10.2 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **4.8** | **5.6** | **16.4** | **19.9** | **25.2** | **26.4** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 4.7 | 5.5 | 18.1 | 19.6 | 23.9 | 21.6 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **17.8** | **18.4** | **3.7** | **74.8** | **87.3** | **16.7** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **125.8** | **132.0** | **4.9** | **609.9** | **617.4** | **1.2** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 36.7 | 49.3 | 34.1 | 212.0 | 246.7 | 16.4 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 30.1 | 28.2 | -6.2 | 131.4 | 126.3 | -3.8 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 38.8 | 36.0 | -7.2 | 190.3 | 160.9 | -15.5 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **61.7** | **39.7** | **-35.7** | **240.6** | **196.3** | **-18.4** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 30.6 | 20.6 | -32.7 | 127.6 | 94.1 | -26.2 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **367.0** | **344.2** | **-6.2** | **1,709.0** | **1,673.8** | **-2.1** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 330.4 | 312.5 | -5.4 | 1,555.4 | 1,529.8 | -1.6 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **-** | **0.1** | **-** | **0.1** | **0.1** | **46.8** |
| **මුළු අපනයන** | **848.6** | **877.6** | **3.4** | **3,846.2** | **4,056.1** | **5.5** |

(අ) තාවකාලික.

…සැලකිය යුතු නොවේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම IV:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන) | අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **262.1** | **256.5** | **-2.1** | **948.8** | **1,058.5** | **11.6** |
| ආහාර හා පාන වර්ග | 121.7 | 139.6 | 14.7 | 500.0 | 577.2 | 15.4 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 5.9 | 8.5 | 44.1 | 40.2 | 46.8 | 16.7 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 22.7 | 22.3 | -1.4 | 68.5 | 73.3 | 6.9 |
| එළවළු (ආ) | 26.1 | 44.3 | 70.2 | 100.0 | 147.0 | 46.9 |
| මුහුදු ආහාර | 3.0 | 9.8 | 222.0 | 13.6 | 39.0 | 187.2 |
| සීනි හා රසකැවිලි | 34.4 | 15.3 | -55.5 | 160.7 | 105.5 | -34.4 |
| කුළුබඩු | 7.8 | 4.0 | -49.3 | 39.9 | 38.7 | -2.8 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 21.9 | 35.4 | 61.8 | 77.2 | 127.0 | 64.6 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 140.4 | 117.0 | -16.7 | 448.8 | 481.2 | 7.2 |
| පෞද්ගලික රථවාහන | 1.2 | 3.1 | 165.3 | 11.4 | 17.5 | 53.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 96.8 | 49.4 | -49.0 | 258.6 | 186.7 | -27.8 |
| ගෘහ උපකරණ | 4.3 | 16.0 | 270.0 | 15.9 | 49.2 | 209.4 |
| රෙදිපිළි හා උපාංග | 11.8 | 13.6 | 15.0 | 57.5 | 70.4 | 22.4 |
| විදුලි සංදේශ උපකරණ | 5.5 | 8.5 | 54.0 | 17.0 | 45.7 | 168.9 |
| ගෘහ හා දැව භාණ්ඩ | 7.6 | 7.9 | 3.5 | 30.7 | 39.4 | 28.5 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 13.2 | 18.5 | 40.2 | 57.8 | 72.3 | 25.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **985.2** | **947.6** | **-3.8** | **3,600.6** | **3,778.5** | **4.9** |
| ඉන්ධන | 523.3 | 359.6 | -31.3 | 1,635.1 | 1,529.7 | -6.4 |
| එයින්, බොරතෙල් | 119.8 | 62.3 | -48.0 | 312.5 | 373.1 | 19.4 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 296.9 | 253.6 | -14.6 | 1,009.3 | 1,015.9 | 0.7 |
| ගල්අඟුරු | 106.6 | 43.7 | -59.0 | 313.3 | 140.7 | -55.1 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 14.9 | 24.4 | 64.2 | 83.0 | 77.1 | -7.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 182.6 | 208.4 | 14.1 | 787.2 | 866.9 | 10.1 |
| කඩදාසි හා ඝන කඩදාසි | 31.5 | 32.8 | 4.0 | 139.6 | 140.0 | 0.3 |
| කෘෂිකාර්මික යෙදවුම් | 16.6 | 20.3 | 22.1 | 86.6 | 80.3 | -7.4 |
| තිරිඟු හා ඉරිඟු | 33.1 | 44.5 | 34.5 | 114.2 | 73.6 | -35.6 |
| මූල ලෝහ | 19.5 | 43.9 | 125.8 | 63.7 | 165.8 | 160.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 32.8 | 47.9 | 46.0 | 141.0 | 176.6 | 25.3 |
| රසායනික නිෂ්පාදිත | 59.7 | 79.1 | 32.6 | 250.8 | 320.0 | 27.6 |
| පොහොර | 10.1 | 5.1 | -49.2 | 50.1 | 23.9 | -52.4 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 12.0 | 22.3 | 85.1 | 52.8 | 88.3 | 67.2 |
| ඛනිජ නිෂ්පාදිත | 4.3 | 7.7 | 80.0 | 24.4 | 38.8 | 58.9 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 45.0 | 51.7 | 14.8 | 172.1 | 197.6 | 14.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **180.3** | **229.6** | **27.4** | **769.9** | **991.4** | **28.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 123.3 | 150.0 | 21.7 | 526.8 | 666.3 | 26.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 50.0 | 68.4 | 36.7 | 215.3 | 283.8 | 31.8 |
| ප්‍රවාහන උපකරණ | 6.8 | 11.1 | 63.4 | 26.8 | 40.5 | 51.4 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.2 | 0.2 | -1.1 | 1.0 | 0.8 | -23.9 |
| **4. වර්ග නොකළ ආනයන** | **3.6** | **1.4** | **-59.6** | **5.8** | **4.7** | **-18.9** |
| **මුළු ආනයන** | **1,431.2** | **1,435.2** | **0.3** | **5,325.2** | **5,833.2** | **9.5** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **907.9** | **1,075.6** | **18.5** | **3,690.1** | **4,303.5** | **16.6** |

(අ) තාවකාලික.
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම V:

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන) | අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **164.6** | **192.0** | **16.6** | **688.5** | **693.9** | **0.8** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 23.0 | 22.5 | -2.0 | 69.0 | 79.4 | 15.1 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 3.1 | 9.8 | 220.5 | 13.9 | 39.3 | 182.1 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 38.7 | 52.9 | 36.7 | 154.3 | 119.6 | -22.5 |
| 05 එළවළු හා පලතුරු | 29.8 | 51.4 | 72.7 | 115.4 | 171.8 | 49.0 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 34.4 | 15.3 | -55.5 | 160.7 | 105.5 | -34.4 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 10.0 | 8.8 | -11.7 | 53.8 | 56.9 | 5.8 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **13.3** | **11.2** | **-15.3** | **38.9** | **33.9** | **-12.8** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **23.2** | **32.9** | **41.6** | **91.4** | **128.3** | **40.4** |
| 23 සකස් නොකළ රබර් | 9.3 | 17.9 | 93.3 | 38.9 | 72.3 | 85.6 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 3.3 | 2.3 | -28.4 | 13.7 | 6.3 | -54.2 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **523.3** | **359.6** | **-31.3** | **1,635.1** | **1,529.7** | **-6.4** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 399.0 | 285.3 | -28.5 | 1,226.7 | 1,274.5 | 3.9 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 17.7 | 30.6 | 72.8 | 95.1 | 114.4 | 20.3 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **9.9** | **21.1** | **113.9** | **37.7** | **69.4** | **84.3** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 9.5 | 19.6 | 105.7 | 34.9 | 64.6 | 85.1 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **193.8** | **178.2** | **-8.0** | **683.2** | **693.2** | **1.5** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 92.3 | 46.0 | -50.2 | 242.9 | 170.5 | -29.8 |
| 56 පොහොර | 10.0 | 5.1 | -49.0 | 50.0 | 23.4 | -53.2 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 21.5 | 33.0 | 53.0 | 88.4 | 118.0 | 33.5 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 8.2 | 11.1 | 35.4 | 40.5 | 44.2 | 9.2 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **303.5** | **389.5** | **28.3** | **1,318.8** | **1,592.5** | **20.8** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 30.5 | 30.7 | 0.5 | 134.5 | 133.2 | -1.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 175.4 | 201.9 | 15.1 | 760.5 | 846.3 | 11.3 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 29.3 | 41.8 | 42.8 | 151.0 | 172.0 | 13.9 |
| 67 යකඩ හා වානේ | 25.7 | 55.8 | 117.3 | 85.1 | 216.1 | 153.8 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **139.9** | **191.0** | **36.6** | **595.8** | **824.4** | **38.4** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 20.9 | 29.7 | 41.9 | 72.4 | 113.5 | 56.7 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 23.7 | 35.5 | 49.4 | 107.7 | 178.2 | 65.4 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 9.6 | 16.9 | 75.7 | 42.9 | 58.4 | 36.0 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 21.3 | 29.1 | 36.6 | 57.3 | 121.0 | 111.0 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 38.1 | 46.6 | 22.2 | 177.1 | 178.2 | 0.6 |
| 78 රථවාහන | 10.0 | 13.9 | 38.2 | 47.0 | 62.6 | 33.1 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **59.0** | **58.2** | **-1.4** | **230.6** | **265.0** | **14.9** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 10.5 | 12.2 | 16.2 | 52.5 | 62.4 | 18.8 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 12.4 | 10.5 | -15.7 | 45.4 | 49.9 | 9.8 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.8** | **1.5** | **88.3** | **5.2** | **2.8** | **-45.8** |
| **මුළු ආනයන** | **1,431.2** | **1,435.2** | **0.3** | **5,325.2** | **5,833.2** | **9.5** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම VI:

## සේවා ගිණුම - ලැබීම් (අ)

| | අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන) | අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **428.6** | **555.8** | **29.7** | **1,701.2** | **2,408.1** | **41.6** |
| **නිෂ්පාදන සේවා** | **1.1** | **10.7** | **861.2** | **6.5** | **14.6** | **123.8** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **2.5** | **3.2** | **28.3** | **13.6** | **18.2** | **33.8** |
| **ප්‍රවාහනය** | **163.6** | **129.8** | **-20.6** | **520.7** | **533.1** | **2.4** |
| මුහුදු ප්‍රවාහනය | 105.9 | 75.5 | -28.7 | 268.7 | 314.6 | 17.1 |
| මගී ගාස්තු | 0.002 | 0.1 | | 0.04 | 0.8 | |
| නැව් කුලී | 21.7 | 48.6 | 124.4 | 124.8 | 198.5 | 59.1 |
| වෙනත් | 84.2 | 26.8 | -68.1 | 143.9 | 115.2 | -19.9 |
| ගුවන් ප්‍රවාහනය | 57.7 | 54.3 | -5.9 | 252.0 | 217.6 | -13.6 |
| මගී ගාස්තු | 21.8 | 25.5 | 17.1 | 106.7 | 103.1 | -3.3 |
| ගුවන් කුලී | 4.5 | 3.3 | -27.1 | 26.2 | 16.2 | -37.9 |
| වෙනත් | 31.4 | 25.5 | -18.8 | 119.1 | 98.2 | -17.6 |
| තැපැල් සේවා | 0.01 | 0.03 | 125.2 | 0.1 | 0.9 | |
| **සංචාරක** | **148.2** | **225.7** | **52.3** | **652.2** | **1,251.6** | **91.9** |
| **ඉදිකිරීම්** | **15.0** | **18.9** | **25.9** | **73.2** | **79.1** | **8.1** |
| විදේශයන්හි ඉදිකිරීම් | 2.1 | 3.6 | 70.1 | 8.7 | 12.0 | 37.9 |
| දේශීය ඉදිකිරීම් | 5.3 | 7.3 | 37.6 | 31.1 | 33.9 | 9.0 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 7.6 | 8.0 | 5.4 | 33.4 | 33.2 | -0.4 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **2.3** | **3.0** | **29.4** | **10.9** | **8.4** | **-22.8** |
| සෘජු රක්ෂණය | 2.2 | 2.7 | 19.6 | 10.6 | 6.2 | -41.2 |
| ප්‍රතිරක්ෂණය | 0.1 | 0.3 | 301.4 | 0.3 | 2.2 | 636.0 |
| **මූල්‍ය සේවා** | **5.3** | **9.2** | **72.5** | **23.4** | **24.7** | **5.9** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **4.2** | **0.0** | **-99.9** | **4.4** | **3.5** | **-17.6** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **62.7** | **113.2** | **80.6** | **299.6** | **320.3** | **6.9** |
| විදුලි සංදේශ සේවා | 7.5 | 42.6 | 468.6 | 41.1 | 62.4 | 51.8 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 55.2 | 70.6 | 27.9 | 258.5 | 257.9 | -0.2 |
| පරිගණක සේවා | 54.8 | 69.6 | 27.1 | 255.5 | 255.3 | -0.1 |
| තොරතුරු සේවා | 0.4 | 1.0 | 141.1 | 2.9 | 2.6 | -11.5 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **20.8** | **38.3** | **83.9** | **82.5** | **145.1** | **75.8** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 1.5 | 3.6 | 140.8 | 5.3 | 14.1 | 168.1 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 3.6 | 11.1 | 205.9 | 23.4 | 54.5 | 132.8 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 15.7 | 23.6 | 50.2 | 53.8 | 76.4 | 42.0 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **2.1** | **2.7** | **27.6** | **11.8** | **7.8** | **-33.6** |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහ ඊට අදාළ සේවා | - | 0.1 | | 0.3 | 2.0 | 631.9 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 2.1 | 2.6 | 20.9 | 11.5 | 5.9 | -49.2 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **0.8** | **1.1** | **43.2** | **2.5** | **1.6** | **-33.3** |

(අ) තාවකාලික. සංචාරක ඉපැයීම් හැර අනෙකුත් සියලුම දත්ත අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වේ. සංචාරක ඉපැයීම් දත්ත, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කරන ලද සමීක්ෂණය මත පදනම් වේ.

**මූලයන්**: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ඇමුණුම VII:

## සේවා ගිණුම - ගෙවීම් (අ)

| | අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන) | අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **138.6** | **188.1** | **35.7** | **628.7** | **759.4** | **20.8** |
| **නිෂ්පාදන සේවා** | **14.3** | **15.2** | **6.9** | **58.8** | **62.4** | **6.2** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **0.2** | **0.2** | **14.1** | **1.3** | **3.2** | **147.9** |
| **ප්‍රවාහනය** | **45.5** | **70.0** | **53.7** | **256.6** | **256.4** | **-0.1** |
| මුහුදු ප්‍රවාහනය | 18.2 | 26.3 | 44.6 | 85.8 | 107.0 | 24.8 |
| මගී ගාස්තු | 0.1 | 0.005 | -95.6 | 0.7 | 0.2 | -67.7 |
| නැව් කුලී | 14.8 | 25.0 | 68.6 | 72.9 | 102.7 | 40.9 |
| වෙනත් | 3.2 | 1.3 | -60.8 | 12.2 | 4.1 | -66.3 |
| ගුවන් ප්‍රවාහනය | 27.4 | 42.9 | 56.8 | 170.1 | 146.7 | -13.7 |
| මගී ගාස්තු | 16.2 | 26.6 | 64.0 | 94.1 | 91.5 | -2.8 |
| ගුවන් කුලී | 4.5 | 5.6 | 25.5 | 31.6 | 17.9 | -43.1 |
| වෙනත් | 6.7 | 10.7 | 60.3 | 44.4 | 37.3 | -16.0 |
| තැපැල් සේවා | - | 0.8 | | 0.7 | 2.6 | 249.1 |
| **සංචාරක** | **9.2** | **19.6** | **114.1** | **39.9** | **72.0** | **80.5** |
| **ඉදිකිරීම** | **15.5** | **12.3** | **-20.6** | **43.7** | **34.7** | **-20.7** |
| විදේශයන්හි ඉදිකිරීම් | 0.04 | 6.1 | 13,691.7 | 1.1 | 9.1 | 742.3 |
| දේශීය ඉදිකිරීම් | 13.2 | 0.1 | -99.6 | 30.0 | 4.1 | -86.2 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 2.3 | 6.2 | 174.4 | 12.7 | 21.5 | 69.1 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **4.2** | **4.4** | **6.3** | **11.5** | **16.9** | **47.1** |
| සෘජු රක්ෂණය | 0.6 | 1.0 | 65.3 | 2.2 | 4.1 | 86.3 |
| ප්‍රතිරක්ෂණය | 3.6 | 3.4 | -3.8 | 9.2 | 12.7 | 37.9 |
| **මූල්‍ය සේවා** | **4.5** | **1.5** | **-66.1** | **19.0** | **31.7** | **66.8** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **2.7** | **6.8** | **150.7** | **14.0** | **38.3** | **173.8** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **13.6** | **14.5** | **6.1** | **79.7** | **65.1** | **-18.3** |
| විදුලි සංදේශ සේවා | 1.3 | 1.4 | 6.6 | 11.8 | 9.4 | -20.1 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 12.4 | 13.1 | 6.0 | 68.0 | 55.7 | -18.0 |
| පරිගණක සේවා | 10.2 | 11.6 | 13.3 | 48.7 | 47.8 | -1.9 |
| තොරතුරු සේවා | 2.1 | 1.5 | -29.0 | 19.2 | 7.9 | -59.0 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **24.2** | **41.6** | **72.0** | **98.0** | **172.5** | **76.1** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 4.3 | 6.4 | 49.5 | 23.2 | 29.3 | 26.4 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 9.6 | 15.1 | 56.7 | 32.9 | 67.3 | 104.2 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 10.3 | 20.1 | 95.6 | 41.9 | 76.0 | 81.5 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **2.81** | **1.5** | **-46.0** | **4.2** | **5.3** | **25.1** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 2.5 | 1.5 | -41.8 | 3.68 | 5.1 | 37.8 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 0.3 | 0.1 | -81.7 | 0.6 | 0.2 | -59.2 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **1.91** | **0.4** | **-80.4** | **2.0** | **0.9** | **-53.4** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම VIII:

## සේවා ගිණුම - ශුද්ධ

| | අප්‍රේල් 2023 (එ.ජ.ඩො. මිලියන) | අප්‍රේල් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-අප්‍රේ. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-අප්‍රේ. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **290.0** | **367.7** | **26.8** | **1,072.5** | **1,648.7** | **53.7** |
| **නිෂ්පාදන සේවා** | **-13.1** | **-4.5** | **-65.4** | **-52.3** | **-47.8** | **-8.5** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **2.3** | **3.0** | **29.5** | **12.3** | **15.0** | **21.9** |
| **ප්‍රවාහනය** | **118.0** | **59.8** | **-49.3** | **264.1** | **276.7** | **4.8** |
| මුහුදු ප්‍රවාහනය | 87.7 | 49.2 | -43.9 | 182.9 | 207.6 | 13.5 |
| මගී ගාස්තු | -0.1 | 0.1 | -165.5 | -0.7 | 0.6 | -188.7 |
| නැව් කුලී | 6.8 | 23.6 | 246.0 | 51.9 | 95.8 | 84.7 |
| වෙනත් | 81.0 | 25.6 | -68.4 | 131.7 | 111.1 | -15.6 |
| ගුවන් ප්‍රවාහනය | 30.3 | 11.4 | -62.4 | 81.9 | 70.9 | -13.5 |
| මගී ගාස්තු | 5.6 | -1.1 | -119.9 | 12.6 | 11.7 | -7.3 |
| ගුවන් කුලී | 0.02 | -2.3 | | -5.4 | -1.7 | -68.5 |
| වෙනත් | 24.8 | 14.8 | -40.1 | 74.7 | 60.9 | -18.5 |
| තැපැල් සේවා | 0.01 | -0.8 | | -0.7 | -1.7 | 149.0 |
| **සංචාරක** | **139.1** | **206.1** | **48.2** | **612.3** | **1,179.6** | **92.7** |
| **ඉදිකිරීම්** | **-0.5** | **6.6** | | **29.5** | **44.4** | **50.8** |
| විදේශයන්හි ඉදිකිරීම් | 2.1 | -2.5 | -220.2 | 7.6 | 2.9 | -62.2 |
| දේශීය ඉදිකිරීම් | -7.9 | 7.3 | -192.4 | 1.2 | 29.8 | |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 5.3 | 1.8 | -66.1 | 20.7 | 11.8 | -43.1 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **-1.9** | **-1.4** | **-22.8** | **-0.6** | **-8.5** | |
| සෘජු රක්ෂණය | 1.6 | 1.7 | 2.6 | 8.4 | 2.1 | -74.8 |
| ප්‍රතිරක්ෂණය | -3.5 | -3.1 | -10.9 | -8.9 | -10.5 | 18.1 |
| **මූල්‍ය සේවා** | **0.8** | **7.7** | | **4.3** | **-7.0** | **-261.9** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **1.5** | **-6.8** | **-560.2** | **-9.5** | **-34.8** | **264.4** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **49.0** | **98.7** | **101.4** | **219.8** | **255.2** | **16.1** |
| විදුලි සංදේශ සේවා | 6.2 | 41.2 | 564.9 | 29.3 | 53.0 | 80.7 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 42.8 | 57.5 | 34.2 | 190.5 | 202.2 | 6.1 |
| පරිගණක සේවා | 44.5 | 58.0 | 30.2 | 206.8 | 207.5 | 0.3 |
| තොරතුරු සේවා | -1.7 | -0.5 | -70.0 | -16.3 | -5.3 | -67.6 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **-3.4** | **-3.3** | **-1.7** | **-15.4** | **-27.4** | **77.6** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | -2.8 | -2.8 | 1.1 | -17.9 | -15.1 | -15.5 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | -6.0 | -3.9 | -34.1 | -9.5 | -12.7 | 33.7 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 5.4 | 3.5 | -36.0 | 11.9 | 0.4 | -96.6 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **-0.7** | **1.2** | **-275.1** | **7.6** | **2.5** | **-66.4** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | -2.5 | -1.3 | -47.5 | -3.4 | -3.1 | -9.4 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 1.8 | 2.5 | 37.5 | 11.0 | 5.6 | -48.7 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **-1.2** | **0.7** | **-160.7** | **0.5** | **0.7** | **56.7** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව